# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයගෙන් 2021 නොවැම්බර් 08 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

## 01. අධීක්ෂක (භූ අලංකරණ) - III ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. i. සිංහල / දෙමළ භාෂාව / ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍ය

ii. ගණිතය සඳහා සම්මාන සහිතව දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

02. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක ප්‍රායෝගික පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

**වැටුප් පරිමාණය** : රු. 31,625-7X300-10X355-37,275 (මාසිකව) - UMT 1 (III) A

**තෝරාගැනීමේ ක්‍රමය** : සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 02. වැඩ අධිකාරී (සිවිල්) II ශ්‍රේණිය

**සුදුසුකම් :**

01. ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) (සිවිල්) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

**සහ**

එම සුදුසුකම ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ සේවයේ වසර 04 ක පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :** වසර 04 ක පළපුරුද්ද සඳහා පාඨමාලාවට අදාළ පුහුණු කාලය ගණනය නොකෙරේ.

02. ජාතික තාක්ෂණික සහතික පත්‍රය (NCT) (සිවිල්) හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම.

**සහ**

එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අදාළ සේවයේ වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : රු. 37,275-18X495-46,185 (මාසිකව) - UMN 2 (II)

**තෝරාගැනීමේ ක්‍රමය** : සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් වරප්‍රසාද**

- **විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමය** : විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලබන මාසික වැටුපෙන් 8% කට සමාන ප්‍රතිශතයක් බැර කරනු ලැබේ.
- **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල** : විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලබන මාසික වැටුපෙන් 7% කට සමාන ප්‍රතිශතයක් බැර කරන අතර, සේවාදායකයාගේ වැටුපෙන් 10% කට සමාන ප්‍රතිශතයක් බැර කරනු ලැබේ.
- **සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල** : වැටුපෙන් 3% කට සමාන ප්‍රතිශතයක් විශ්වවිද්‍යාලය විසින් බැර කරනු ඇත.
- **ජීවන වියදම් දීමනාව** : මාසිකව රු. 7,800/- කි. (දැනට පවත්නා නීති රීතිවලට අනුව)
- **අනෙකුත් දීමනා** : රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

අයදුම්පත් සහ අදාළ විස්තර සහකාර ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල යන ලිපිනයෙන් හෝ https://gwu.ac.lk යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත හා ජීවදත්ත පත්‍රය සමග අදාළ අධ්‍යාපනික සහතික පිටපත් (ප්‍රතිඵල සටහන් සහිතව), වෘත්තීයමය, බාහිර ක්‍රියාකාරකම් සහ සේවා පිටපත් සමග, අයදුම්පත් භාර ගන්නා අවසන් දින (2021-11-08) හෝ එදිනට පෙර **සහකාර ලේඛකාධිකාරී / අනධ්‍යයන ආයතන, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, එහි මෘදු පිටපත (Soft copy) officenacad@gwu.ac.lk යන විද්‍යුත් ලිපිනයටද යොමු කළ යුතුය. අයදුම් කරන තනතුර අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි හා විද්‍යුත් ලිපියෙහි මාතෘකාව (Subject) යන්නෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් සහ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් මෙන්ම අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ / හෝ අනෙකුත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**

**යක්කල.**

2021-10-14